
# බෙදීම - 3



## දෙකෙන් බෙදමු. ඉතුරු බලමු.

පැන්සල් 27ක් කණ්ඩායම් දෙකකට සමානව බෙදූ විට එක් කණ්ඩායමකට ලැබෙන පැන්සල් ගණන කීය ද? ඉතුරු කීය ද?



එක් කණ්ඩායමකට ලැබෙන පැන්සල් ගණන = 13

ඉතුරු පැන්සල් ගණන = 1

## දීර්ඝ බෙදීමේ ක්‍රමයට පිළිතුර ලබා ගනිමු.

```
    1 3
2 | 2 7
  | 2 ↓
  -----
    0 7
      6
    ---
      1  ←—— ඉතුරු
```

27 ÷ 2 = **13 ඉතුරු 1**



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# බෙදීම - 3

## දීර්ඝ බෙදීමේ ක්‍රමයට අභ්‍යාස පොතෙහි ලියා පිළිතුරු සොයමු.

(1) $17 \div 2$

(2) $19 \div 2$

(3) $25 \div 2$

(4) $29 \div 2$

(5) $61 \div 2$

(6) $2\overline{)\,27}$

(7) $2\overline{)\,23}$

(8) $2\overline{)\,49}$

(9) $2\overline{)\,41}$

(10) $2\overline{)\,45}$

## දීර්ඝ බෙදීමේ ක්‍රමයට අභ්‍යාස පොතෙහි ලියා විසඳමු.

(1) ටිකිරි ළඟ චොකලට් බෝල 21ක් තිබිණි. නංගි සමග සමානව බෙදා ගත් විට එක් අයකුට කීයක් ලැබේ ද? ඉතුරු කීය ද?

(2) සමන්මලී ළඟ වළලු 29ක් තිබේ. ඒවා ෆාතිමා සමග සමානව බෙදා ගත් විට එක් අයකුට කීයක් ලැබේ ද? ඉතුරු කීය ද?

(3) වෙරළු ගෙඩි 44ක් ඇත. වෙරළු ගෙඩි දෙක බැගින් ළමයි කී දෙනකුට බෙදිය හැකි ද?

(4) ක්‍රිෂ්ණා ළඟ ලොවි ගෙඩි 47ක් ඇත. ලොවි ගෙඩි දෙක බැගින් යහළුවන් කී දෙනකුට බෙදිය හැකි ද? ඉතුරු කීය ද?

(5) රඹුටන් ගෙඩි 65ක් ඇත. එක් අයකුට දෙක බැගින් ළමයි කී දෙනකුට බෙදිය හැකි ද? ඉතුරු කීය ද?



නොමිලේ බෙදා හැරීම සඳහා ය.